# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2024 අප්‍රේල් මස 10 වන දින

## II වන කොටස

## අතිරේකය

(2024.04.17 දින නිකුත් කරන ලදී)

### ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය

**ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ස්ත්‍රී පුරුෂ තැනැත්තන් පිළිබඳ කේන්ද්‍රස්ථානය පත් කිරීම සහ නම් කිරීම සඳහා ද; වෙනස් වූ ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවයක් සහිත තැනැත්තන් වෙනුවෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය තහවුරු කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ සහ එයට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගේ
නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 42.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

එල්.ඩී.ඕ. 43/2023

**ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ස්ත්‍රී පුරුෂ තැනැත්තන් පිළිබඳ කේන්ද්‍රස්ථානය පත් කිරීම සහ නම් කිරීම සඳහා ද; වෙනස් වූ ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවයක් සහිත තැනැත්තන් වෙනුවෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය තහවුරු කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ සහ එයට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

පූර්විකාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සියලු තැනැත්තන් නීතිය ඉදිරියේ සමාන වන බවට සහ නීතියේ සමාන රැකවරණයක් ලැබීමට හිමිකම් ලබන බවට සහ වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය, උපන් ස්ථානය යන හේතුමත හෝ ඉන් කවර වූ හෝ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය නොවී සියලු අයිතිවාසිකම් හා නිදහස භුක්ති විඳීමට හිමිකම් ලබන බවට පිළිගෙන ඇති හෙයින් ද:

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියෙහි ස්ත්‍රී පුරුෂභාවය හෝ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අනන්‍යතාව සම්බන්ධයෙන් වූ වෙනස්කම් නොසලකා හරිමින් සියලුම තැනැත්තන් වෙත සමාන අවස්ථා රජය විසින් සහතික කරනු ලබන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ත්‍රී පුරුෂ අසමානතාවය දුරලීම පිණිස කාන්තාවන්ගේ ප්‍රගතිය සඳහා නීතියෙන් හෝ අනුනීතිවලින් හෝ විධායක ක්‍රියා මාර්ගයෙන් හෝ විශේෂ විධිවිධාන සැලැස්වීම පිළිගනු ලැබ ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2024 .......... දරන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

පනතේ අරමුණු

**2.** පනතේ අරමුණු පනත දැක්වෙන පරිදි විය යුතු ය; එනම් -

(අ) සමාජීය, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික සහ තාක්ෂණික ප්‍රතිපත්ති සැදීමේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ මූලධර්ම ස්ථාපිත කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලැස්වීම;

(ආ) ස්ත්‍රී පුරුෂභාවය හෝ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අනන්‍යතාව මත පදනම්ව වෙනස්කම්වලට භාජනය වීමෙන් තොරව සෑම තැනැත්තකුම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් සහ නිදහස භුක්ති විඳින බවට සහතික වීම;

(ඇ) ප්‍රතිපත්ති, වැඩසටහන් සහ වෙනස් වූ ස්ත්‍රී පුරුෂ අනන්‍යතාව සහිත පුද්ගලයන්ට සේවා සැපයීමේ දී ඍජු සහ වක්‍ර ලෙස වෙනස්කම්වලට භාජනය කිරීම, අන්තර්ඡේදනය සහ බහු වෙනස්කම් කිරීම් ඇතුළුව ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසමානතාවයේ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් වෙනස්කම් කිරීමේ පද්ධතිමය සහ ව්‍යුහාත්මක හේතු හඳුනා ගැනීම සහ ඉවත් කිරීම සඳහා පහසුකම් සැලැස්වීම;

(ඈ) පුරුෂයන්ට, ස්ත්‍රීන්ට සහ වෙනස් වූ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අනන්‍යතා සහිත තැනැත්තන්ට සිදුවන අවාසි සහගත තත්ත්වයන් සමනය කිරීමට, ආන්තිකරණය, ස්ත්‍රී පුරුෂභාවය නිසා සිදුවන වෙනස්කම්, අපකීර්තියට පත්කිරීම, වර්ගීකරණය, අගතියට පත්වීම සහ ප්‍රචණ්ඩත්වයට භාජනය කිරීමට ස්ත්‍රී පුරුෂභාවය මත පදනම්ව සමාජය තුල ගතානුගතික භූමිකාවන්ට ඔවුන් සීමාකිරීම, එරෙහිව පියවර ගැනීම සහ ව්‍යුහාත්මක වෙනසක් තුළින් එම තැනැත්තන් වෙත අවස්ථාව ලබාදීම සඳහා පියවර ගැනීම;

(ඉ) ස්ත්‍රී පුරුෂභාවය හෝ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අනන්‍යතාවය නොසලකා හරිමින් මානව ගෞරවය ආරක්ෂා කිරීම;

(ඊ) ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා සමාන අවස්ථා සහ සුදුසු වටපිටාවක් සැපයීම; සහ

(උ) ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවයේ මූලධර්ම ස්ථාපිත කිරීම සහ රාජ්‍ය ආයතන, ව්‍යාපාර, සිවිල් සමාජ සංවිධාන, රැකියාවන්හි දී සහ වෙනත් නෛතික ආස්ථිත්ව සහ තනි පුද්ගලයන්ගේ ක්‍රියාකාරකම්වල දී එම මූලධර්මවලට අනුකූලව ක්‍රියා කිරීම තහවුරු කිරීම.

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය ආරක්ෂා කිරීම සහ ඉහළ නැංවීම

**3.** සෑම තැනැත්තකුටම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සඳහා අයිතියක් තිබිය යුතු අතර, කිසිදු තැනැත්තකුට එම අයිතිය අහිමි කරනු නොලැබිය යුතු ය.

මේ පනත ක්‍රියාත්මක කිරීම සහතික කිරීමේ දී අමාත්‍යවරයාගේ බලතල

**4.** (1) මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සඳහා සහ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා, අමාත්‍යවරයා විසින් පහත සඳහන් පරිදි වග කියනු ලැබිය යුතු ය. එනම් -

(අ) 5 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව පිළිබඳ සභාව විමසා (මෙහි මින්මතු "වැඩපිළිවෙල" යනුවෙන් සඳහන් කරනු ලබන) ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සඳහා පහසුකම් සැලැස්වීම පිණිස සහ එය තහවුරු කිරීම පිණිස වූ වැඩපිළිවෙලක් නියම කිරීම;

(ආ) රජයේ ආයතන සහ පෞද්ගලික ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන සැලසුම් සහ පියවර ඇතුළු වැඩපිළිවෙල ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා නියෝග ආකාරයෙන් මාර්ගෝපදේශ නිකුත් කිරීම;

(ඇ) වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය ආයතන සහ පෞද්ගලික ආයතන විසින් වාර්ෂිකව ඉදිරිපත් කරනු ලබන සැලසුම් සහ පියවර පිළිබඳ තොරතුරු රැස්කිරීම, විශ්ලේෂණය කිරීම සහ යාවත්කාලීන කිරීම;

(ඈ) (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් කරුණුවලට අදාළ වාර්තා සහ යාවත්කාලීන කිරීම් කැඳවීම සහ රාජ්‍ය ආයතන සහ පෞද්ගලික ආයතන විසින් වැඩපිළිවෙලට අනුකූලව ක්‍රියා කිරීම තහවුරු කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ කාර්ය පටිපාටි සහ පියවර නිශ්චිතව දැක්වීම;

(ඉ) රාජ්‍ය ආයතනවල සහ පෞද්ගලික ආයතනවල පරිපාලන කාර්යපටිපාටි සහ ව්‍යවහාරයන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ප්‍රකාර ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ පිළිගත් ප්‍රමිතීන් සහ සම්මතයන්ට අනුකූල වන බවට තහවුරු කිරීම සඳහා නිතිපතා නියාමන සහ ඇගයීම් පියවර ක්‍රියාත්මක කිරීම;

(ඊ) ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා පියවර සහ යාන්ත්‍රණ නියම කිරීම;

(උ) ස්ත්‍රී පුරුෂභාවය පාදක වූ ප්‍රචණ්ඩත්වය සහ වෙනස්කොට සැලකීම යන කාරණා සඳහා සහන ලබාගැනීම පිණිස වෙනස් වූ ස්ත්‍රී පුරුෂ අනන්‍යතා සහිත තැනැත්තන් සඳහා සහාය වීම සඳහා සහයෝගය ලබා දෙනු ලබන පද්ධතියක් ඇති කරනු ලබන ආකාරය නියම කිරීම; සහ

(ඌ) මේ පනතේ විධිවිධාන සමඟ අනනුකූල නොවන සහ මේ පනතේ අරමුණු සාක්ෂාත්කර ගැනීම සඳහා අවශ්‍ය වන වෙනත් සියලු දේ.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද යම් මාර්ගෝපදේශයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන යම් තැනැත්තකු විසින් එම අනුකූලව ක්‍රියා නොකිරීම සඳහා හේතු ලිඛිතව අමාත්‍යවරයා වෙත දැනුම් දිය යුතු ය. එසේ ලබා දී ඇති හේතු පිළිබඳව අමාත්‍යවරයා සෑහීමට පත් වේ නම්, අනුකූලව ක්‍රියා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් ඔහු වෙත ලබා දී ඇති කාලසීමාව තවදුරටත් දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(3) යම් තැනැත්තකු විසින්, (2) වන උපවගන්තියේ සඳහන් දීර්ඝ කරන ලද කාලසීමාව ඇතුළත, අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූලව ක්‍රියාකර නොමැති අවස්ථාවල දී, අමාත්‍යවරයා විසින් එම අනුකූලව ක්‍රියා නොකිරීම පිළිබඳව අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබිය හැකි ය.

I වන කොටස

**ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ සභාව පිහිටුවීම**

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ සභාව පිහිටුවීම

**5.** (1) (මෙහි මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ සභාව යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) සභාව, (1) වන උපවගන්තිය මගින් එයට පවරන ලද නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, එකී නාමයෙන් එය විසින් හා එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

සභාවේ සංයුතිය

**6.** (1) සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:-

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන් පස්දෙනෙකුගෙන්, එනම් -

(i) කාන්තා විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු;

(ii) අධිකරණ විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු;

(iii) අධ්‍යාපන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු;

(iv) යෞවන කටයුතු විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු;

(v) පොලිස්පතිවරයා හෝ නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු; සහ

(ආ) (මෙහි මින්මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරන ලද පහත දැක්වෙන සාමාජිකයන් හතර දෙනාගෙන්:-

(i) ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයනය හෝ සෞඛ්‍ය අධ්‍යයනය යන ක්ෂේත්‍රවල විශිෂ්ඨත්වයක් ලබා ඇති තැනැත්තන් අතරින් දෙදෙනකුගෙන්; සහ

(ii) මානව හිමිකම් හෝ සමාජ සවිබල ගැන්වීමේ ක්ෂේත්‍රය පිළිබඳ විශිෂ්ඨත්වයක් ලබා ඇති තැනැත්තන් අතරින් තැනැත්තන් දෙදෙනකුගෙන්,

සමන්විත විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ සිදු කරන ලද පත් කිරීම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිඹිබු කරනු ලබන බවට තහවුරු කරනු ලැබිය යුතු ය.

සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

7. සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය -

(අ) ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම, ඉහළ නැංවීම සහ වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් රජය වෙත අවශ්‍ය පියවර නිර්දේශ කිරීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ඒකාබද්ධ යාන්ත්‍රණයක් ලබා ගැනීම;

(ආ) ව්‍යවස්ථාදායකය ඉදිරියේ පවතින දැනට සම්මත කර නොමැති කාන්තාවන් පිළිබඳ බලපෑමක් ඇතිවිය හැකි පනත් කෙටුම්පත් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම පිළිබඳ දැක්මක් සහිතව සුපරීක්ෂණයට ලක් කිරීම;

(ඇ) මේ පනත යටතේ නියමකර ඇති නියෝග සහ විධාන සකස් කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත උපදෙස් ලබාදීම;

(ඈ) ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සාමානාත්මතාවය පිළිබඳ අයිතිවාසිකම් සාක්ෂාත් කර ගැනීම, ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා අදාළ රාජ්‍ය ආයතන සහ පෞද්ගලික ආයතන විමසා යම් විධාන ලබා දීම සහ අවශ්‍ය වෙනත් සියලු පියවර ගැනීම;

(ඉ) ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා යෝජනා ක්‍රම ආරම්භ කර ක්‍රියාත්මක කිරීම;

(ඊ) ස්ත්‍රී පුරුෂ අසමානතාව පිළිබඳ මූලික හේතු හඳුනාගෙන ඒවා වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා අවශ්‍ය ඵලදායී පියවර ප්‍රවර්ධනය කිරීම;

(උ) ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ ගැටළු මුඛ්‍යකරණය සහ ඒ සම්බන්ධයෙන් වන පියවර ක්‍රියාත්මක කිරීම පිළිබඳව, කථානායකවරයා විසින් පත්කරන ලද කාන්තා මන්ත්‍රීවරියන්ගේ සංසදය වෙත පිටපතක් සහිතව අමාත්‍යවරයා වෙත වාර්තා කිරීම;

(ඌ) ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ පියවර ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන සහ පෞද්ගලික ආයතන වෙත අවශ්‍ය සහාය ලබා දීම;

(එ) (ඌ) ඡේදය යටතේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම

පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා රාජ්‍ය ආයතන සහ පෞද්ගලික ආයතන ඇගයීම;

(ඒ) සමාජයේ සහ සේවා ස්ථානවල දී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීමේ කාර්ය සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ ගැටලුව ප්‍රධාන ධාරාව තුලට ගැනීම සහ ඩිජිටල්කරණය කිරීම ඇතුලු පර්යේෂණ, අධ්‍යාපනික වැඩසටහන් සහ වෙනත් පියවර භාර ගැනීම;

(ඔ) රාජ්‍ය නිලධරයන් සහ පොදු මහජනතාව වෙත ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ කාලීන දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම;

(ඕ) ස්ත්‍රී පුරුෂභාවය ආශ්‍රිත ගැටලු පිළිබඳ දැණුවත්භාවය, අධ්‍යාපනය සහ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම;

(ක) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික වැඩ සැලසුමක් ප්‍රවර්ධනය කිරීම;

(ග) වාර්ෂික වැඩ සැලැස්ම ප්‍රකාරව වාර්ෂික ප්‍රගතිය සමාලෝචන කිරීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය තහවුරු කිරීම සඳහා කඩිනම් අවධානය යොමු කිරීම පිණිස අදාළ අමාත්‍යවරයා වෙත වාර්තා කිරීම සඳහා ඒ පිළිබඳ අමාත්‍යවරයා වෙත වාර්තා කිරීම; සහ

(ච) සභාවේ සියලු හෝ යම් කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය වන වෙනත් සියලු ක්‍රියා සහ දේ ඉටුකිරීම;

**8.** සභාවේ සෑම පත් කළ සාමාජිකයකු ම මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් ධුරය කලින් හිස් කළහොත් මිස, ඔහු පත් කළ දින සිට වසර තුනක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කළහොත් මිස, අනුගාමී හෝ අනන්‍යාකාරයකින් වන එක් වැඩිදුර කාලසීමාවකට නොවැඩි කාලසීමාවක් සඳහා නැවත පත් කිරීමට සුදුස්සකු විය යුතු ය. ධුර කාලය

**සභාවේ සභාපතිවරයා**

**9.** (1) අමාත්‍යවරයා විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ විශිෂ්ඨත්වයක් පෙන්නුම් කරනු ලබන යම් පත්කළ සාමාජිකයකු සභාවේ සභාපතිවරයා ලෙස පත් කළ යුතු ය.

(2) අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සභාපතිවරයාට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් එම ලිපිය පිළිගනු ලැබූ දින සිට බලාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්, හේතු දක්වා සභාපතිවරයා, සභාපති ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය ඔහු විසින් සභාවේ සාමාජිකත්වය දරන කාලසීමාව විය යුතු ය.

(5) රෝගාතුර වීම, වෙනත් අශක්නුතාවක්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් කරුණක් හේතුවෙන් සභාපතිවරයාට ස්වකීය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය තාවකාලිකව ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, පත් කළ සාමාජිකයකු ලෙස වන ස්වකීය සාමාන්‍ය කාර්යවලට අමතරව සභාපතිවරයා ලෙස කටයුතු කිරීමට වෙනත් යම් පත් කළ සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

**සභාවේ සාමාජිකයකු වීමට නුසුදුසුකම්**

**10.** යම් තැනැත්තකු-

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ වුවහොත්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසන් වුවහොත්;

(ඇ) නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් මගින් බුන්වත් පුද්ගලයකු බවට විනිශ්චය කරනු ලැබ ඇත්නම් හෝ බුන්වත්භාවයට පත්ව ඇත්නම්;

(ඈ) රෝගාතුර වීම හෝ වෙනත් යම් මානසික හෝ ශාරීරික අශක්නුතාවකට පත්වීම හේතුවෙන් ධුරයේ තවදුරටත් කටයුතු කිරීමට නුසුදුසු වන්නේ නම් හෝ නුසුදුසු බවට පත්වුවහොත්;

(ඉ) නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් සිහිවිකල් තැනැත්තකු බවට ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලබන්නේ නම්;

(ඊ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් මගින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ සිර දඬුවමක් විඳ ඇත්නම් හෝ විඳිමින් සිටී නම්; හෝ

(උ) සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරන ලද කලින් ධූර කාලය තුළ ධූරයෙන් ඉවත් කර ඇත්නම්,

ඒ තැනැත්තා සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු ලෙස දිගටම කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

ඉල්ලා අස්වීම සහ ඉවත් කිරීම

11. (1) සභාවේ යම් පත් කළ සාමාජිකයකු, තත්කාර්ය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින්, ඕනෑම විටක දී, ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලිඛිතව පිළිගනු ලැබූ දින සිට බලාත්මක විය යුතු ය.

(2) යම් පත් කළ සාමාජිකයකු රෝගාතුර වීම, අශක්නුතාවයට පත්වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් තාවකාලිකව ස්වකීය ධූරයේ කර්තව්‍ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් 6 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඔහු වෙනුවට කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින්, පත්කළ සාමාජිකයකු හේතු දක්වා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. ධූරයෙන් ඉවත් කරනු ලැබ ඇති පත් කළ සාමාජිකයකු සභාවේ සාමාජිකයකු ලෙස නැවත පත් කිරීම සඳහා හෝ වෙනත් යම් තත්ත්වයකින් සභාවේ සේවය කිරීම සඳහා නුසුදුස්සකු වන්නේ ය.

(4) පත් කළ සාමාජිකයකු මිය යෑම, ධූරයෙන් ඉල්ලා අස්වීම හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබීම යන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් 6 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඔහු වෙනුවට

වෙනත් තැනැත්තෙකු පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කළ තැනැත්තා විසින් තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉතිරිව ඇති කාලසීමාව සඳහා ධුරය දැරිය යුතු ය.

සභාවේ ගණපූරණය සහ රැස්වීම්

**12.** (1) සභාවේ රැස්වීම්, යටත් පිරිසෙයින් සෑම මසකට වරක්වත් පවත්වනු ලැබිය යුතු අතර, සභාවේ රැස්වීමක් සඳහා වන ගණපූරණය සාමාජිකයන් පස්දෙනෙකු විය යුතු ය.

(2) සභාපතිවරයා සභාවේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරින් තෝරා පත් කර ගත් සාමාජිකයකු එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(3) සභාවේ රැස්වීමක්-

(අ) රැස්වීම සඳහා නියම කර ගත් ස්ථානයේ, දිනයේ සහ වේලාවේ රැස්ව සිටින ගණපූරණය සංයුක්ත කරනු ලබන සාමාජික සංඛ්‍යාවක් මගින්; හෝ

(ආ) සහභාගී වන සහ ගණපූරණය සම්පූර්ණ කරනු ලබන සාමාජිකයන්ට, රැස්වීම පැවැත්වෙන කාලය අතරතුර සහභාගී වන සෑම සාමාජිකයකු ම, එකවරම දැකිය හැකි සහ ඇසිය හැකි ශ්‍රව්‍ය-දෘශ්‍ය සන්නිවේදන මාධ්‍ය මගින්,

පවත්වනු ලැබිය හැකි ය.

(4) සභාවේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු සෑම ප්‍රශ්නයක් ම, එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමාන වන අවස්ථාවක, සභාපතිවරයාට ස්වකීය ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(5) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට යටත්ව, සභාව විසින් සභාවේ රැස්වීම් සහ එම රැස්වීම්වල කටයුතු සම්බන්ධයෙන් වන කාර්යපටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

**13.** සභාවේ සාමාජිකයන්ගේ වැටුප් පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලැබිය යුතු අතර ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සාමාජිකයන් විසින් යම් සම්බන්ධතාවක් හෙළිදරව් කිරීම

**14.** සභාව විසින්, යම් කරුණක් පිළිබඳව ගනු ලබන යම් තීරණයක් සම්බන්ධයෙන් කෙලින් ම හෝ වක්‍රාකාරයෙන් යම් සම්බන්ධතාවන් දක්වන සාමාජිකයකු විසින් එම තීරණය ගනු ලබන්නා වූ සභාවේ රැස්වීමේ දී, එම සම්බන්ධතාවයේ ස්වභාවය හෙළිදරව් කරනු ලැබිය යුතු අතර, එම හෙළිදරව් කිරීම සභාවේ රැස්වීම්වල සටහන්වල වාර්තා කරනු ලැබිය යුතු ය. තව ද, එම කරුණ සම්බන්ධයෙන් වන සභාවේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට එම සාමාජිකයා සහභාගී නොවිය යුතු අතර, එම සාකච්ඡාව පැවැත්වෙන හෝ එම තීරණය ගැනීම කෙරීගෙන යන අතරතුර දී එම සාමාජිකයා එම රැස්වීමෙන් ඉවත්ව සිටිය යුතු ය.

පුරප්පාඩුවක් පැවතීම හේතුවෙන් ක්‍රියාපටිපාටිය, ක්‍රියාව හෝ තීරණය බලරහිත නොවිය යුතු බව

**15.** සභාවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීම හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් පැවතීම හේතුවෙන් ම පමණක්, සභාවේ කිසිම ක්‍රියාපටිපාටියක්, ක්‍රියාවක් හෝ තීරණයක් බලරහිත නොවිය යුතු ය.

## II වන කොටස

### සභාවේ කාර්ය මණ්ඩලය

සභාවේ කාර්ය මණ්ඩලය

**16.** (1) සභාවේ කාර්යයන් නිසි ලෙස හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා සභාවට අවශ්‍ය යයි හැඟෙන පරිදි, සභාවට එවැනි නිලධරයන් සහ සේවකයන් සංඛ්‍යාවක් පත් කළ හැකි ය.

(2) සභාව විසින් -

(අ) යම් ලිඛිත නීතියකට සහ රජය විසින් කලින් කලට නිකුත් කරනු ලබන යම් මාර්ගෝපදේශයන්ට යටත්ව නිලධරයන්ගේ සහ සේවා නියුක්තිකයන්ගේ පාරිශ්‍රමික සහ බඳවා ගැනීමේ පටිපාටි ඇතුළුව සේවා කොන්දේසි නියම කිරීම;

(ආ) සභාවේ යම් නිලධරයකු හෝ සේවා නියුක්තිකයකුගේ විනය පාලනය ක්‍රියාත්මක කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම; සහ

(ඇ) සභාවේ නිලධරයන් සහ සේවකයන්ගේ සුභසාධනය උදෙසා අර්ථසාධක අරමුදලක් සහ වෙනත් යම් සුභසාධන

යෝජනා ක්‍රම ඇති කිරීම සහ නියාමනය කිරීම මෙන්ම එවැනි අරමුදලක් හෝ යෝජනා ක්‍රම සඳහා දායක මුදල් ලබා දීම,

සිදු කරනු ලැබිය හැකි ය.

(3) සභාවේ ඉල්ලීම පරිදි, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, එම නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ එම නිලධරයා පත්කරන ලද අධිකාරියේ කැමැත්ත ඇතිව සභාව විසින්, නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා සභාවට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලැබිය හැකි ය.

(4) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, එම නිලධරයා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය.

(5) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, එම නිලධරයා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ කරගනු ලැබිය යුතු ය.

(6) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා රජය වෙනුවෙන් සේවය කිරීමට එකඟ වී ඇති යම් තැනැත්තකු සභාව විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක, එම තැනැත්තා විසින් සභාවේ සේවය කරනු ලබන යම් කාලසීමාවක් එම ගිවිසුම යටතේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා රජයට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) සභාව විසින්, සභාවේ කටයුතු සඳහා සහය වීම පිණිස පත් කරන ලද යම් නිලධරයකු වෙත සභාවේ කාර්යක්ෂම ක්‍රියාත්මකවීම සඳහා අවශ්‍ය කරනු ලැබිය හැකිතාක් දුරට එහි යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය පවරනු ලැබිය හැකි අතර, එසේ යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය පවරන ලද යම් තැනැත්තකු විසින් සභාවේ පාලනයට

සහ විධානයට යටත්ව එම බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කළ යුතු ය. සභාව විසින්, මේ උපවගන්තිය යටතේ සිදු කරන ලද යම් බලය පැවරීමක් ඉවත් කර ගනු ලැබිය හැකි ය.

## III වන කොටස

## ස්ත්‍රී පුරුෂ තැනැත්තන් පිළිබඳ කේන්ද්‍රස්ථානය

*ස්ත්‍රී පුරුෂ තැනැත්තන් පිළිබඳ කේන්ද්‍රස්ථානය*

**17.** (1) සෑම රාජ්‍ය ආයතනයක් සහ පෞද්ගලික ආයතනයක් විසින් ම ස්වකීය කාර්ය මණ්ඩලය අතරින් ස්ත්‍රී පුරුෂභාවය මුඛ්‍යකරණය කිරීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවට අදාළ ක්‍රියාකාරකම් හඳුනාගැනීම සහ වාර්තා කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු (මෙහි මින්මතු "ස්ත්‍රී පුරුෂ තැනැත්තන් පිළිබඳ කේන්ද්‍රස්ථානය" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකු පත් කිරීම හෝ නම් කිරීම කරනු ලැබිය යුතු ය.

(2) ස්ත්‍රී පුරුෂ තැනැත්තන් පිළිබඳ කේන්ද්‍රස්ථානය යනු අතිරේක ලේකම්වරයකුගේ තනතුරට වඩා පහළ නොවන යම් තනතුරක් දරනු ලබන යම් නිලධරයකු හෝ අදාළ ආයතනයේ යම් අතිරේක හෝ නියෝජ්‍ය ප්‍රධානියකු විය යුතු අතර ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ ගැටළු සම්බන්ධයෙන් පිළියම් ලබා දීමේ දී අදාළ ආයතනය සමග සම්බන්ධතා පවත්වනු ලබන ප්‍රධාන ස්ථානය විය යුතු ය.

(3) ස්ත්‍රී පුරුෂ තැනැත්තන් පිළිබඳ කේන්ද්‍රස්ථානය විසින් ස්වකීය වගකීම් ක්ෂේත්‍ර ඉලක්ක කරමින් වැඩ සැලසුමක් සකස්කර පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංසදය වෙත පිටපතක් ද සහිතව කාර්තුමය පදනමක් මත එය සභාව වෙත ඍජුවම වාර්තා කරනු ලැබිය යුතු ය.

*ස්ත්‍රී පුරුෂ තැනැත්තන් පිළිබඳ කේන්ද්‍රස්ථානයේ කර්තව්‍ය*

**18.** සෑම එක් එක් ස්ත්‍රී පුරුෂ තැනැත්තන් පිළිබඳ කේන්ද්‍රස්ථානයක්ම විසින් ස්වකීය පිළිවෙලින් වූ රාජ්‍ය ආයතනයක් ඇතුළත -

(අ) ස්ත්‍රී පුරුෂභාවයේ සමානාත්මතාවය පිළිබඳ ප්‍රතිපත්ති සහ ව්‍යවහාරයන් ක්‍රියාත්මක වීම සහතික කරනු ලැබිය යුතු ය;

(ආ) වැඩසටහන්වල දී ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ ප්‍රශ්න ප්‍රධාන ධාරාවට යොමු කිරීම සම්බන්ධයෙන් වගකියනු ලැබිය යුතු ය;

(ඇ) ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය අත්කර ගැනීම කෙරෙහි සහ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ ප්‍රශ්නය ප්‍රධාන විෂය ධාරාවට යොමුකිරීම සඳහා ඒ වෙනුවෙන් අයවැය කිරීම ප්‍රකාර වූ ප්‍රතිපත්ති සහ වැඩසටහන් අධීක්ෂණය කර සංශෝධනය කිරීම පිණිස සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(ඈ) ස්ත්‍රී පුරුෂභාවය පදනම් වූ වෙනස් කොට සැලකීම් සහ ප්‍රචණ්ඩත්වය අවම කිරීම සඳහා වැඩසටහන්, පද්ධති සහ වැඩපිළිවෙල සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(ඉ) ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ දෘෂ්ටිකෝණ සම්බන්ධයෙන් සහ ස්ත්‍රී පුරුෂභාවය සම්බන්ධ අයවැයකරණ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ සොයා බැලීම්, විශ්ලේෂණ සහ විගණන පැවැත්වීම;

(ඊ) තීරණ ගැනීමේ ක්‍රියාවල දී ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ තුලනයක් ප්‍රවර්ධනය කිරීම සඳහා උත්සාහ කිරීම;

(උ) වැඩපිළිවෙලහි දී සිදුවන ලිංගික හිංසනයන් සම්බන්ධ විමර්ශනවල දී ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ මාර්ගෝපදේශවලට අනුකූලව ක්‍රියාකිරීම ප්‍රවර්ධනය කිරීම;

(ඌ) පීඩාවන්ගෙන් සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර වටපිටාවක් නිර්මාණය කිරීම සහ උචිත සෝදිසි කිරීමේ යාන්ත්‍රණ ඇති කිරීම;

(එ) ස්ත්‍රී පුරුෂභාවය පදනම් වූ ප්‍රචණ්ඩත්වය සහ වෙනස්කොට සැලකීම මගින් බලපෑමට ලක්වූ තැනැත්තන් විසින් උපදේශන සේවා සහ සෞඛ්‍ය රැකවරණ සේවා වෙත ප්‍රවේශය ලබාදීම; සහ

(ඒ) වාර්ෂික වැඩ සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා සභාව වෙත සහාය දැක්වීම.

IV වන කොටස

මුදල්

සභාවේ අරමුදල

**19.** (1) (මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) සභාවට එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) (අ) සභාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කලට වෙන් කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන්;

(ආ) මේ පනත යටතේ සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටුකිරීමේ දී සභාවට ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන්; සහ

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව කුමන හෝ යම් මූලාශ්‍රයකින් ආදායම්, ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග වශයෙන් සභාවට ලැබෙන සියලු අමතර මුදල්,

අරමුදලට බැර කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, සභාව විසින්, සභාව වෙත කරන ලද සියලු විදේශ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය.

(3) (අ) මේ පනත යටතේ තම බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටුකිරීමේ දී සභාව විසින් දරන ලද යම් වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල්; සහ

(ආ) මේ පනත මගින් හෝ මේ පනත යටතේ අරමුදලින් ගෙවනු ලැබීමට අවශ්‍ය සියලු මුදල්, අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සභාව විසින් ගිණුම් පවත්වාගෙන යාම

**20.** සභාව විසින්, එයට සුදුසු යයි සිතන යම් රාජ්‍ය බැංකුවක යම් ගිණුමක් විවෘත කර පවත්වාගෙන යා හැකි අතර, එම ගිණුම් රජයේ සංස්ථාවල මුදල් ගනුදෙනුවලට අදාළව රජයේ පවතින මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය

**21.** (1) සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සභාව විසින්, එහි ආදායම් සහ වියදම්, වත්කම් සහ වගකීම් සහ සභාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනයට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සභාවේ ගිණුම් විගණනය සඳහා අදාළ විය යුතු ය.

## V වන කොටස

### සාමාන්‍ය

වාර්ෂික වාර්තාව

**22.** (1) සභාව විසින් එක් එක් මුදල් වර්ෂය අවසානයේ මාස හයක කාලයක් ඇතුළත එම මුදල් වර්ෂය තුළ සභාව විසින්, කරගෙන යන ලද කාර්ය පිළිබඳ වාර්ෂික වාර්තාවක් අමාත්‍යවරයා වෙත භාර දිය යුතු අතර, එම වර්ෂයට අදාළව පහත දැක්වෙන එක් එක් ලේඛනවලින් පිටපත බැගින් වාර්තාවට අමුණනු ලැබිය යුතු ය.

(අ) විගණකාධිපතිවරයාගේ වාර්තාව සමඟ අදාළ වර්ෂය සඳහා සභාවේ විගණනය කරන ලද ගිණුම්; සහ

(ආ) එම වාර්තාව සහ ගිණුම් අදාළ වන වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන වර්ෂය සඳහා යෝජිත කර්තව්‍ය පිළිබඳ වාර්තාවක්.

(2) (1) වන උපවගන්තිය යටතේ භාරදෙන ලද වාර්තාව ලැබුනු දින සිට මාස හයක කාලයක් ඇතුළත එම වාර්තාව සහ ලේඛනවල පිටපත් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

නිල රහස්‍යතාව

**23.** සභාවේ සෑම සාමාජිකයකු ම සහ සභාවේ සෑම නිලධරයකු ම සහ සේවා නියුක්තිකයකු විසින් ස්වකීය කාර්ය බාර ගැනීමට පෙරාතුව ම මේ පනත යටතේ තම බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී තමාට දැන

ගැනීමට ලැබෙන සභාවේ කටයුතු සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් පූර්ණ රහස්‍යභාවය රැකීමට ප්‍රතිඥා දෙමින් ප්‍රකාශයකට අත්සන් තැබිය යුතු අතර, එම ප්‍රකාශය මගින් තමාට දැනගැනීමට ලැබෙන කිසිම එවැනි ම තොරතුරක් -

(අ) අධිකරණ නීතියක් විසින් එසේ කිරීමට නියම කර ඇති විට; හෝ

(ආ) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ බලතල සහ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමේ හෝ ඉටු කිරීමේ කාර්යයක් සඳහා,

යන අවස්ථාවල දී හැර, එවැනි යම් කිසිදු කාරණයක් හෙළිදරව් නොකිරීමට ඔහු විසින් ප්‍රතිඥා දිය යුතු ය.

සභාවේ බලතල පැවරීම

**24.** (1) සභාව විසින්, ලිඛිතව එහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, සභාව වෙත පවරා ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය සභාපතිවරයාට හෝ සභාවේ වෙනත් නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි අතර, එම වෙනත් නිලධාරියා විසින් එකී බලතල, කාර්ය සහ කර්තව්‍ය සභාවේ නමින් සහ සභාව වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම, කිරීම, ඉටු කිරීම සිදු කරනු ලැබිය යුතු ය.

(2) සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ සිදුකරන ලද කිසිදු පැවරීමක් නොතකා, එසේ පවරන ලද යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය එය විසින්ම ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම සිදුකරනු ලැබිය හැකි අතර, එවැනි යම් බලය පැවරීමක් යම් අවස්ථාවක දී ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබිය හැකි ය.

වැරදි

**25.** (අ) මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන යම් නියෝග උල්ලංඝනය කරනු ලබන; හෝ

(ආ) කොමිෂන් සභාවේ නියමයක් හෝ විධානයන්ට අනුකූල වීමට අපොහොසත් වන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස් දහසක් නොඉක්මවන

දඩයකට හෝ මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීම හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන වරද දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

**පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි**

**26.** මේ පනත යටතේ වූ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරන ලද අවස්ථාවක දී -

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වන්නේ නම්, එම සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු ම, ලේකම්වරයකු ම සහ නිලධරයකු ම වරදට වරදකරුවකු වශයෙන් සලකනු ලැබිය යුතුය; සහ

(ආ) එම පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් වන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි, එම ව්‍යාපාර ආයතනයේ අධ්‍යක්ෂවරයා, ලේකම්වරයා, නිලධරයකු හෝ හවුල්කරුවකු එම වරද සිදුකරන ලද්දේ එම අධ්‍යක්ෂවරයාගේ, ලේකම්වරයාගේ, නිලධරයාගේ හෝ හවුල්කරුගේ අනුදැනුම නොමැතිව බව හෝ සභාව එම වරද සිදු කිරීමෙන් වැළැක්වීම සඳහා ඔවුන් විසින් සියලු උද්යෝගයෙන් ක්‍රියා කරන ලද බව ඔප්පු කළහොත් මිස, එම වරදට වරදකරුවකු වශයෙන් සලකනු ලැබිය යුතු ය.

**නියෝග**

**27.** (1) මේ පනත මගින් නියම කරනු ලැබිය යුතු යයි නියමිත හෝ නියෝග සෑදිය යුතු යැයි මේ පනත මගින් බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එම පළකිරීම් දින සිට හෝ එහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් යම් පසුව එළඹෙන දිනයක සිට එවැනි සෑම නියෝගයක්ම බලාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම, හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොවන සෑම නියෝගයක්ම එම

අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට එමගින් හානියක් නොවිය යුතු ය,

(4) එසේ යම් නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු බව

**28.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා, මේ පනතේ සඳහන් විධිවිධාන ඒ යටතේ සඳහන් විධිවිධාන, ඒ යටතේ සාදන ලද යම් නියෝග සහ මාර්ගෝපදේශ, ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ සමානාත්මතාවය අත්කර ගැනීමට සහ ප්‍රවර්ධනය කිරීමට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් බලපානු ලැබිය යුතු ය.

(2) මේ පනතේ සඳහන් විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද යම් නියෝග සහ මාර්ගෝපදේශ සහ වෙනත් යම් නීතියක්, නියෝග හෝ මාර්ගෝපදේශ අතර යම් අනනුකූලතාවක් පවතින අවස්ථාවක දී, මේ පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද යම් නියෝග සහ මාර්ගෝපදේශ බලාත්මක විය යුතු ය.

අර්ථ නිරූපණය

**29.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස-

"වෙනස්කොට සැලකීම" යන්නෙන් ජාතිය, කුලය, වර්ණය, ස්ත්‍රී පුරුෂභාවය, ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අනන්‍යතාවය, ජාතිකත්ව සම්භවය, භාෂාව, ආගම, වයස, විවාහක අවිවාහකභාවය, මව්පියභාවය, අශක්නුතාවය හෝ සෞඛ්‍ය තත්ත්වය ඇතුලු යම් විශේෂිත ගති ලක්ෂණයක් මත පදනම් කොටගෙන තනි පුද්ගලයකුට හෝ පුද්ගල කණ්ඩායමකට වෙනත් ආකාරයෙන් සැලකීම අදහස් වේ;

"ඍජු වෙනස්කොට සැලකීම" යන්නෙන්, ස්ත්‍රී පුරුෂභාවය හෝ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අනන්‍යතාවය යන හේතු මත පදනම්ව ප්‍රකාශිතව වෙනස්කොට සැලකීම අදහස් වේ;

"ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අනන්‍යතාවය" යන්නෙන්, කාන්තාවන්, පුරුෂයන් සහ වෙනත් තැනැත්තන් සාමාජීය ලෙස සැකසී ඇගයීමට ලක්ව ඇත්තා වූ සංස්කෘතික, ආර්ථිකමය, සමාජීය සහ දේශපාලනික ගතිලක්ෂණ, කාර්යභාර සහ අවස්ථා අදහස් වේ;

"ස්ත්‍රී පුරුෂභාවය පදනම්ව වෙනස්කොට සැලකීම" යන්නෙන්, දේශපාලනික, ආර්ථික, සමාජීය, සංස්කෘතික, සිවිල් හෝ වෙනත් ක්ෂේත්‍රයක දී තැනැත්තන්ගේ සාමානාත්මතාවය, මානව හිමිකම් සහ මූලික නිදහස් මත පදනම් වන පිළිගැනීම දුබලකිරීමේ හෝ නිශ්ප්‍රභ කිරීමේ බලපෑමක් ඇත්තා වූ හෝ එවැනි අරමුණක් සහිතව ස්ත්‍රී පුරුෂභාවය හෝ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අනන්‍යතාවය මත සිදුකරන යම් වෙනස්කමක්, බැහැරකිරීමක් හෝ සීමා කිරීමක් අදහස් වේ;

"ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අයවැයකරණය" යන්නෙන්, ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අනන්‍යතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් යුතුව අයවැය ස්ත්‍රී පුරුෂභාවය පදනම්ව තක්සේරු කිරීමක්, සම්පත් වෙන්කිරීම සහ බදුකරණය පිළිබඳ ප්‍රතිපත්තියක්, අයවැය ක්‍රියාවලියේ විවිධ මට්ටම්වලදී ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ යම් දර්ශනයක් ඇතුලත් කිරීම සහ ස්ත්‍රී පුරුෂභාවීය සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම පිණිස ආදායම් හා වියදම් ප්‍රතිව්‍යුහගත කිරීම අදහස් කරනු ලබන අයවැය ක්‍රියාවලියේ දී ස්ත්‍රී පුරුෂභාවය මුඛ්‍යකරණය කිරීමේ යෙදවුමක් වේ;

"ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය" යන්නෙන්, ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ වෙනස්කමකට භාජනය කිරීමෙන් තොරව ස්ත්‍රී පුරුෂ භාවය සහ වෙනස් වූ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අනන්‍යතාවක් සහිත තැනැත්තන් අතර සමානාත්මතාවය අදහස් වන අතර එයට-

(අ) අධ්‍යාපනය;

(ආ) සේවානියුක්තිය;

(ඇ) සෞඛ්‍ය රැකවරණය සහ සෞඛ්‍ය රැකවරණ තොරතුරු;

(ඈ) පෞද්ගලික සහ පවුල් ජීවිතය;

(ඉ) සාධාරණත්වය සහ ආරාවුල් විසඳීම;

(ඊ) පොදු ස්ථාන සහ ගොඩනැගිලි;

(උ) පොදු සේවා;

(ඌ) මාධ්‍ය, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ;

(එ) ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂාවීම; සහ

(ඒ) ආර්ථික, දේශපාලනික සහ සමාජ ක්‍රියාකාරකම්,භුක්තිවිඳීමේ සහ ඒවාට ප්‍රවේශවීමේ සමාන අවස්ථා,

ඇතුලත් වේ;

"ස්ත්‍රී පුරුෂභාවය මුඛ්‍යකරණය කිරීම" යන්නෙන්, සියලුම ක්ෂේත්‍රවල සහ සියලුම මට්ටම්වල දී නීති, ප්‍රතිපත්ති හෝ වැඩසටහන් ඇතුලු ව සැලසුම් කළ ක්‍රියාකාරකමක් පිළිබඳ ස්ත්‍රී පුරුෂ, ස්ත්‍රී පුරුෂභාවය සහ වෙනස් වූ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අනන්‍යතාවක් සහිත තැනැත්තන් සඳහා වන බලපෑම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය අදහස් වේ;

"වක්‍ර වෙනස්කොට සැලකීම" යන්නෙන්, ස්ත්‍රී පුරුෂභාවය හෝ වෙනස් වූ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අනන්‍යතාවයක් සහිත තැනැත්තන්ට අදාලවන

තාක් දුරට යම් නීතියක්, ප්‍රතිපත්තියක්, වැඩසටහනක් හෝ ව්‍යවහාරයක් මධ්‍යස්ථවන බවට පෙනීයන අවස්ථාවක සිදුවන වෙනස්කොට සැලකීමක් අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, මේ පනත ක්‍රියාත්මක කිරීම පැවරී ඇත්තා වූ අමාත්‍යවරයා අදහස් වේ;

"නියමිත" යන්නෙන් මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කරන ලද යන්න අදහස් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, යම් ලිඛිත නීතියක් මගින් හෝ යම් ලිඛිත නීතියක් යටතේ පිහිටවනු ලැබූ හෝ පිහිටවනු ලබන්නා වූ ද, රජය විසින් සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් අරමුදල් හෝ ප්‍රාග්ධනය සපයනු ලැබ ඇත්තා වූ ද යම් සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

"රාජ්‍ය ආයතනය" යන්නෙන්, රජයේ දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක්, රාජ්‍ය සංස්ථාවක් හෝ ව්‍යවස්ථාපිත ආයතනයක් අදහස් වන අතර, ඊට රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් විසින් හෝ සම්පූර්ණ වශයෙන් අරමුදල් සපයා ඇති උසස් අධ්‍යාපන ආයතනයක්, විශ්ව විද්‍යාලයක් සහ වෘත්තීය ආයතනයක් සහ වෘත්තීය හෝ කාර්මික අධ්‍යාපනය සපයන ආයතනයක් අදහස් වේ; සහ

"පෞද්ගලික ආයතනය" යන්නෙන්, යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද, පිළිගනු ලැබූ හෝ බලපත්‍රලත් ආයතනයක් අදහස් වන අතර, ඊට රජය විසින් සම්පූර්ණ වශයෙන් අරමුදල් සපයා නොමැති උසස් අධ්‍යාපන ආයතනයක්, විශ්ව විද්‍යාලයක් සහ වෘත්තීය ආයතනයක් සහ වෘත්තීය හෝ කාර්මික අධ්‍යාපනය ලබාදෙන යම් ආයතනයක් ද ඇතුළත් වේ.

**31.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව